අනන්ත නය සමන්නාගත චතුවීසති

# සමන්ත පට්ඨාන

අති ගම්භීර ධර්ම

වන්දනාව

ධර්ම දානය පිණිසයි

මෙම පට්ඨාන ධර්මය සජ්ඣායනා කිරීමෙන් ලෞකික-ලෝකෝත්තර වශයෙන් ලැබෙන ආනිසංස බොහෝය.

මේ ජීවිතයේදී මෙන්ම මතු උපදින ජීවිතවලදී තියුණු ඥානය ලැබීමටද, සියලු කෙලෙස් නසා අර්හත්වය ලැබීමටද, රහත්වන ජීවිතයේදී චතුපටිසම්භිදා-ඤාණලාභී වීමටද මෙම ධර්මය සජ්ඣායනා කිරීම හේතු වන්නේය.

බුරුම රටෙහි බොහෝ රියදුරෝ රිය අනතුරු වළක්වා ගැනීම පිණිස මෙම ධර්මය සජ්ඣායනා කරති. සමහර ව්‍යාපාරිකයෝද තම ව්‍යාපාර කටයුතුවල දියුණුව සඳහා මෙම ධර්මය සජ්ඣායනා කරති. එසේම හදිසි අනතුරු වළක්වා ගැනීමටද, සතුරු උපද්‍රව වලින් බේරීමටද, තම ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීමටද, තම බලාපොරොත්තු ඉටුකර ගැනීමටද, දෙවියන්ගේ ආරක්ෂාව ලබා ගැනීමටද මෙම ධර්මය භාවිත කරන බොහෝ අය එම රටෙහි ඇත්තාහ. බුරුම රටෙහි දිනපතා ගුවන්විදුලිය මගින් මෙම ධර්ම සජ්ඣායනාව විකාශයට පත්කිරීමෙන් රටෙහි ආරක්ෂාව හා දියුණුව සඳහා මෙම පට්ඨාන ධර්මය භාවිත කරයි.

එහෙයින් බොහෝ ආනිසංස ලබා දෙන මෙම මහඟු ධර්මය දිනපතා සජ්ඣායනා කර තම තමාගේ ජීවිත සාර්ථක කරගැනීමට සියළු දෙනා උත්සාහ කරත්වා!

ශෛදයසාගර පාරගත වූ අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ ලොවිතුරා බුද්ධත්වයට පැමිණීම සඳහා සම්මර්ශනය කළ ධර්මය හේතු-ඵල ධර්මයයි. තථාගතයන් වහන්සේගේ සර්වාංගසම්පූර්ණ අති දීර්ඝ හේතු-ඵල දේශනය වනුයේ මේ පට්ඨාන ධර්මයයි. එසේම බුදුවීමෙන් අනතුරුව සතරවන සතියේදී තථාගත ශ්‍රී ශරීරයෙන් නීල-පීත-ලෝහිතාදී සවණක් ඝන බුදුරුස් මාලාවන්ගෙන් මේ මුළු ලෝකධාතුවම ආලෝකමත් වූයේද මෙම පට්ඨාන ධර්මය මෙනෙහි කරන කල්හිය. වසර 45 ක් මුළුල්ලෙහි දේශනාකොට වදාළ ධර්මය අතුරින් මුදුන්මල්කඩ වන්නේද, ශ්‍රී සම්මා සම්බුද්ධ ශාසනයෙහි හදවත බඳු වන්නේද, මහාගතිගම්ය තිස්සදත්ත තෙරුන්වහන්සේ ඇතුළු බොහෝ දෙනාට අරිහත්වයට මඟ පාදා දුන්නේද මේ පට්ඨාන ධර්මයයි.

නමුත් සර්වඥශාසනය විනාශ වන කල්හි මුලින්ම අභාවයට පැමිණීමට නියමිතව ඇත්තේද මේ පට්ඨාන ධර්මයයි. එමනිසා ශ්‍රද්ධා ප්‍රඥා ඇති පණ්ඩිත සත්පුරුෂ සියළුදෙනා මෙම ධර්මය මතකයෙන් දරා ගැනීමෙන්ද, තමන් නිතර සජ්ඣායනා කිරීමෙන්ද, තම හිතවතුන් ඒ සඳහා උනන්දු කරවීමෙන්ද, ඒ අප මහා කාරුණිකයන් වහන්සේ සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පුරා දුක්විඳ අප වෙනුවෙන්ම අවබෝධ කළ මෙම වටිනා ධර්මය අතුරුදහන් වීමට ඉඩ නොදී, තවත් චිරාත් කාලයක් ලෝසතුනට හිතසුව පිණිස රැක ගැනීමට අධිෂ්ඨාන පිහිටුවා ගනිත්වා!

# නමෝ තස්ස භගවතෝ අරහතෝ

# සම්මාසම්බුද්ධස්ස

# පට්ඨානදේසකස්ස !!!

විචිත්ත මති ගම්භීර - මනන්ත නය මණ්ඩිතං
පට්ඨානං සම්මසන්තස්ස - විමලාමිත බුද්ධියා

යස්ස දේහා නික්ඛමිංසු - සුභා ඡබ්බණ්ණ රංසියෝ
නීල පීතා රත්ත සේතා - මඤ්ජිට්ඨා ච පභස්සරා

තං ලෝකනාථං සුගතං - ධම්මඤ්ච ජින සේවිතං
සංඝං නිරංගණං සෙට්ඨං - නමාමි සිරසාදරං

හේතුපච්චයෝ, ආරම්මණපච්චයෝ, අධිපතිපච්චයෝ, අනන්තරපච්චයෝ, සමනන්තරපච්චයෝ, සහජාතපච්චයෝ, අඤ්ඤමඤ්ඤපච්චයෝ, නිස්සයපච්චයෝ, උපනිස්සයපච්චයෝ, පුරේජාතපච්චයෝ, පච්ඡාජාතපච්චයෝ, ආසේවනපච්චයෝ, කම්මපච්චයෝ, විපාකපච්චයෝ, ආහාරපච්චයෝ, ඉන්ද්‍රියපච්චයෝ, ඣානපච්චයෝ, මග්ගපච්චයෝ, සම්පයුත්තපච්චයෝ, විප්පයුත්තපච්චයෝ, අත්ථිපච්චයෝ, නත්ථිපච්චයෝ, විගතපච්චයෝ, අවිගතපච්චයෝ'ති.

## 1 හේතුපච්චයෝ'ති

හේතූ හේතුසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං හේතුපච්චයේන පච්චයෝ.

හේතු පච්චය ඤාණේන - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 2 ආරම්මණපච්චයෝ’ති

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ.

සද්දායතනං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ.

රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ.

ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ.

රූපායතනං, සද්දායතනං, ගන්ධායතනං,

රසායතනං, ඵොට්ඨබ්බායතනං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ. සබ්බේ ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ.

යං යං ධම්මං ආරබ්භ යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්තචේතසිකා ධම්මා, තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං ආරම්මණපච්චයේන පච්චයෝ.

ආරම්මණ ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 3 අධිපතිපච්චයෝ'ති

ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයේන පච්චයෝ.

විරියාධිපති විරියසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයේන

පච්චයෝ.

චිත්තාධිපති චිත්තසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයේන පච්චයෝ.

වීමංසාධිපති වීමංසසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයේන පච්චයෝ.

යං යං ධම්මං ගරුං කත්වා යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්තචේතසිකා ධම්මා, තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං අධිපතිපච්චයේන පච්චයෝ.

අධිපති ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 4 අනන්තරපච්චයෝ’ති

චක්ඛුවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං

අනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

සෝතවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

ඝානවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

ජිව්හාවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං

සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

කායවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

යේසං යේසං ධම්මානං අනන්තරා යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්තචේතසිකා ධම්මා, තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං අනන්තරපච්චයේන පච්චයෝ.

අනන්තර ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

**5 සමනන්තරපච්චයෝ'ති**

චක්ඛුවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං

සමනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

සෝතවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

ඝානවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

ජිව්හාවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං

සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

කායවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. මනෝධාතු තං සම්පයුත්තකාච ධම්මා මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

යේසං යේසං ධම්මානං සමනන්තරා යේ යේ ධම්මා උප්පජ්ජන්ති චිත්තචේතසිකා ධම්මා, තේ තේ ධම්මා තේසං තේසං ධම්මානං සමනන්තරපච්චයේන පච්චයෝ.

සමනන්තර ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

**6 සහජාතපච්චයෝ'ති**

චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයේන පච්චයෝ. චත්තාරෝ මහාභූතා

අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයේන පච්චයෝ. ඔක්කන්තික්ඛණේ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයේන පච්චයෝ.

චිත්තචේතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං සහජාතපච්චයේන පච්චයෝ. මහාභූතා උපාදාය රූපානං සහජාතපච්චයේන පච්චයෝ.

රූපිනෝ ධම්මා අරූපීනං ධම්මානං කිඤ්චි කාලේ සහජාතපච්චයේන පච්චයෝ. කිඤ්චි කාලේ න සහජාතපච්චයේන පච්චයෝ.

සහජාත ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 7 අඤ්ඤමඤ්ඤපච්චයෝ’ති

චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤපච්චයේන පච්චයෝ. චත්තාරෝ මහාභූතා අඤ්ඤමඤ්ඤපච්චයේන පච්චයෝ. ඔක්කන්තික්ඛණේ නාමරූපං

අඤ්ඤමඤ්ඤපච්චයේන පච්චයෝ.

අඤ්ඤමඤ්ඤ ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 8 නිස්සයපච්චයෝ'ති

චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයේන පච්චයෝ. චත්තාරෝ මහාභූතා අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයේන පච්චයෝ. ඔක්කන්තික්ඛණේ නාමරූපං අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයේන පච්චයෝ.

චිත්තචේතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං නිස්සයපච්චයේන පච්චයෝ. මහාභූතා උපාදාය රූපානං නිස්සයපච්චයේන පච්චයෝ.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයේන පච්චයෝ.

සෝතායතනං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයේන පච්චයෝ.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයේන පච්චයෝ.

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයේන පච්චයෝ.

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයේන පච්චයෝ.

යං රූපං නිස්සාය මනෝධාතුච මනෝවිඤ්ඤාණධාතුච වත්තන්ති, තං රූපං මනෝධාතුයාච මනෝවිඤ්ඤාණධාතුයාච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයේන පච්චයෝ.

නිස්සය ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 9 උපනිස්සයපච්චයෝ'ති

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං කේසඤ්චි උපනිස්සයපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං කේසඤ්චි උපනිස්සයපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයේන පච්චයෝ.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයේන පච්චයෝ.

උතුභෝජනං'පි උපනිස්සයපච්චයේන පච්චයෝ. පුග්ගලෝ'පි උපනිස්සයපච්චයේන පච්චයෝ. සේනාසනං'පි උපනිස්සයපච්චයේන පච්චයෝ.

උපනිස්සය ඤාණේන - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 10 පුරේජාතපච්චයෝ'ති

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

සෝතායතනං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

සද්දායතනං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

රූපායතනං, සද්දායතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

යං රූපං නිස්සාය මනෝධාතුච මනෝවිඤ්ඤාණධාතුච වත්තන්ති, තං රූපං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරේජාතපච්චයේන පච්චයෝ.

මනෝවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච

ධම්මානං කිඤ්චිකාලේ පුරේජාතපච්චයේන පච්චයෝ. කිඤ්චිකාලේ න පුරේජාතපච්චයේන පච්චයෝ.

පුරේජාත ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 11 පච්ඡාජාතපච්චයෝ'ති

පච්ඡාජාතා චිත්තචේතසිකා ධම්මා පුරේජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාතපච්චයේන පච්චයෝ.

පච්ඡාජාත ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 12 ආසේවනපච්චයෝ'ති

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසේවනපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං

අකුසලානං ධම්මානං ආසේවනපච්චයේන පච්චයෝ. පුරිමා පුරිමා කිරියාබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කිරියාබ්‍යාකතානං ධම්මානං ආසේවනපච්චයේන පච්චයෝ.

ආසේවන ඥාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 13 කම්මපච්චයෝ’ති

කුසාලාකුසලං කම්මං විපාකානං ඛන්ධානං කටත්තාච රූපානං කම්මපච්චයේන පච්චයෝ. චේතනා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං කම්මපච්චයේන පච්චයෝ.

කම්මපච්චය ඥාණේන - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 14 විපාකපච්චයෝ’ති

විපාකා චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං විපාකපච්චයේන පච්චයෝ.

විපාක ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 15 ආහාරපච්චයෝ’ති

කබලිංකාරෝ ආහාරෝ ඉමස්ස කායස්ස ආහාරපච්චයේන පච්චයෝ. අරූපිනෝ ආහාරා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ආහාරපච්චයේන පච්චයෝ.

ආහාර ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 16 ඉන්ද්‍රියපච්චයෝ’ති

චක්ඛුන්ද්‍රියං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං

සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයේන පච්චයෝ.

සෝතින්ද්‍රියං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයේන පච්චයෝ.

ඝානින්ද්‍රියං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයේන පච්චයෝ.

ජිව්හින්ද්‍රියං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයේන පච්චයෝ.

කායින්ද්‍රියං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයේන පච්චයෝ.

රූපජීවිතින්ද්‍රියං කටත්තාරූපානං ඉන්ද්‍රියපච්චයේන පච්චයෝ. අරූපිනෝ ඉන්ද්‍රියා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රියපච්චයේන පච්චයෝ.

ඉන්ද්‍රිය ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 17 ඣානපච්චයෝ'ති

ඣානංගානි ඣානසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඣානපච්චයේන පච්චයෝ.

ඣානපච්චය ඤාණේන - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 18 මග්ගපච්චයෝ'ති

මග්ගංගානි මග්ගසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං මග්ගපච්චයේන පච්චයෝ.

මග්ගපච්චය ඤාණේන - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 19 සම්පයුත්තපච්චයෝ’ති

චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං සම්පයුත්තපච්චයේන පච්චයෝ.

සම්පයුත්ත ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 20 විප්පයුත්තපච්චයෝ’ති

රූපිනෝ ධම්මා අරූපීනං ධම්මානං විප්පයුත්තපච්චයේන පච්චයෝ. අරූපිනෝ ධම්මා රූපීනං ධම්මානං විප්පයුත්තපච්චයේන පච්චයෝ.

විප්පයුත්ත ඤාණජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 21 අත්ථිපච්චයෝ’ති

චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයේන පච්චයෝ. චත්තාරෝ මහාභූතා

අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයේන පච්චයෝ. ඔක්කන්තික්ඛණේ නාමරූපං අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයේන පච්චයෝ.

චිත්තචේතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අත්ථිපච්චයේන පච්චයෝ. මහාභූතා උපාදාය රූපානං අත්ථිපච්චයේන පච්චයෝ.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

සෝතායතනං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

සද්දායතනං සෝතවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

රූපායතනං, සද්දායතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

යං රූපං නිස්සාය මනෝධාතුච මනෝවිඤ්ඤාණධාතුච වත්තන්ති, තං රූපං මනෝධාතුයාච මනෝවිඤ්ඤාණධාතුයාච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයේන පච්චයෝ.

අත්ථිපච්චය ඤාණේන - ඡබ්බණ්ණ රංසි භාසුරං සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 22 නත්ථිපච්චයෝ'ති

සමනන්තරනිරුද්ධා චිත්තචේතසිකා ධම්මා පටුප්පන්නානං චිත්තචේතසිකානං ධම්මානං නත්ථිපච්චයේන පච්චයෝ.

නත්ථිපච්චය ඤාණේන - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 23 විගතපච්චයෝ'ති

සමනන්තරවිගතා චිත්තචේතසිකා ධම්මා පටුප්පන්නානං චිත්තචේතසිකානං ධම්මානං විගතපච්චයේන පච්චයෝ.

විගත ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

## 24 අවිගතපච්චයෝ'ති

චත්තාරෝ ඛන්ධා අරූපිනෝ අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයේන පච්චයෝ. චත්තාරෝ මහාභූතා අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයේන පච්චයෝ. ඔක්කන්තික්ඛණේ නාමරූපං අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයේන පච්චයෝ.

චිත්තචේතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අවිගතපච්චයේන පච්චයෝ. මහාභූතා උපාදාය රූපානං අවිගතපච්චයේන පච්චයෝ.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

සෝතායතනං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

කායායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

සද්දායතනං සෝතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

රූපායතනං, සද්දායතනං, ගන්ධායතනං, රසායතනං, ඵොට්ඨබ්බායතනං මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන

පච්චයෝ.

යං රූපං නිස්සාය මනෝධාතුච මනෝවිඤ්ඤාණධාතුච වත්තන්ති, තං රූපං මනෝධාතුයාච මනෝවිඤ්ඤාණධාතුයාච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයේන පච්චයෝ.

අවිගත ඤාණ සංජාත - ඡබ්බණ්ණ රංසි භාසුරං
සම්බුද්ධං සබ්බ දස්සාවිං - වන්දාමි පූජයාමහං

ඒතේන සච්චවජ්ජේන සොත්ථි මේ හෝතු සබ්බදා
ඒතේන සච්චවජ්ජේන සොත්ථි තේ හෝතු සබ්බදා
ඒතේන සච්චවජ්ජේන සොත්ථි තේ හෝතු සබ්බදා

සාධූ ! සාධූ ! සාධූ !

**බුද්ධසාසනං චිරං තිට්ඨතු !!!**

## අනන්ත නය සමන්නාගත සමන්ත පට්ඨාන මහා ප්‍රකරණය දේසනා කොට වදාලා වූ ඒ භාග්‍යවත් වූ අරිහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!

හේතු ප්‍රත්‍යය, ආරම්මණ ප්‍රත්‍යය, අධිපති ප්‍රත්‍යය, අනන්තර ප්‍රත්‍යය, සමනන්තර ප්‍රත්‍යය, සහජාත ප්‍රත්‍යය, අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය, නිස්සය ප්‍රත්‍යය, උපනිස්සය ප්‍රත්‍යය, පුරේජාත ප්‍රත්‍යය, පච්ඡාජාත ප්‍රත්‍යය, ආසේවන ප්‍රත්‍යය, කර්ම ප්‍රත්‍යය, විපාක ප්‍රත්‍යය, ආහාර ප්‍රත්‍යය, ඉන්ද්‍රිය ප්‍රත්‍යය, ඣාන ප්‍රත්‍යය, මාර්ග ප්‍රත්‍යය, සම්ප්‍රයුත්ත ප්‍රත්‍යය, විප්පයුත්ත ප්‍රත්‍යය, අත්ථි ප්‍රත්‍යය, නත්ථි ප්‍රත්‍යය, විගත ප්‍රත්‍යය, අවිගත ප්‍රත්‍යය.

### 1 හේතු ප්‍රත්‍යය යනු

හේතූහු හේතුසම්පයුත්ත ධර්මයන්ටද ඒ නිසා හටගන්නා වූ රූපන්ටද හේතු ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**2 ආරම්මණ ප්‍රත්‍යය යනු**

රූපායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සද්දායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ගන්ධායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රසායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඵොට්ඨබ්බායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය මනෝධාතුවටද ඒ

හා යෙදුන ධර්මයන්ටද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සියළු ධර්මයෝ මනෝවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් යම් ධර්මයක් අරමුණු කොට යම් යම් චිත්ත චෛතසික ධර්ම උපදිත්ද ඒ ඒ අරමුණ ඒ ඒ ධර්මයන්ට ආරම්මණ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**3 අධිපති ප්‍රත්‍යය යනු**

ඡන්දාධිපතිය ඡන්දය යෙදුන ධර්මයන්ටද ඒ නිසා උපදින රූපයන්ටද අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

විරියාධිපති වීරිය යෙදුන ධර්මයන්ටද ඒ නිසා උපදින රූපයන්ටද අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චිත්තාධිපතිය චිත්තසම්පයුත්ත ධර්මයන්ටද ඒ නිසා උපදින රූපයන්ටද අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

වීමංසාධිපතිය වීමංසසම්පයුත්ත ධර්මයන්ටද ඒ නිසා උපදින රූපායන්ටද අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් යම් ධර්මයක් ගරු කොට යම් යම් චිත්ත චෛතසික ධර්ම උපදිත්ද ඒ ඒ අරමුණ ඒ ඒ ධර්මයන්ට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**4 අනන්තර ප්‍රත්‍යය යනු**

චක්ඛුවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෝතවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඝානවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර

ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ජිව්හාවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

කායවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව අකුසල ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව

පූර්ව අකුසල ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් යම් ධර්මයන්ට අනතුරුව යම් යම් චිත්ත චෛතසික ධර්ම උපදිත්ද ඒ ඒ ධර්මයෝ ඒ ඒ ධර්මයන්ට අනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**5 සමනන්තර ප්‍රත්‍යය යනු**

චක්ඛුවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෝතවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර

ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඝානවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ජිව්හාවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

කායවිඤ්ඤාණධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මනෝධාතුවද ඒ හා යෙදුන ධර්මයෝද මනෝවිඤ්ඤාණධාතුවට හා යෙදුන ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව අකුසල ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අකුසල ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් යම් ධර්මයන්ට අනතුරුව යම් යම් චිත්ත චෛතසික ධර්ම උපදිත්ද ඒ ඒ ධර්මයෝ ඒ ඒ ධර්මයන්ට සමනන්තර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**6 සහජාත ප්‍රත්‍යය යනු**

අරූපී ස්කන්ධ සතර ඔවුනොවුන්ට සහජාත

ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සතර මහාධාතූහු ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාම-රූප ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චිත්ත චෛතසික ධර්මයෝ චිත්තජ රූපයන්ට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මහාභූත සතර උපාදායරූපයන්ට සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

වත්ථු රූපය අරූපී ධර්මයන්ට ප්‍රතිසන්ධියේදී සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රවෘත්තිකාලයේදී සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නොවේ.

**7 අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය යනු**

අරූපී ස්කන්ධ සතර ඔවුනොවුන්ට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සතර මහාධාතූහු ඔවුනොවුන්ට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාම-රූප ඔවුනොවුන්ට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**8 නිස්සය ප්‍රත්‍යය යනු**

අරූපී ස්කන්ධ සතර ඔවුනොවුන්ට නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සතර මහාධාතූහු

ඔවුනොවුන්ට නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාම-රූප ඔවුනොවුන්ට නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චිත්ත චෛතසික ධර්මයෝ චිත්තජ රූපයන්ට නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මහාභූත සතර උපාදායරූපයන්ට නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චක්ඛායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෝතායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඝානායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ජිව්හායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

කායායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් රූපයක් නිශ්‍රයකොට මනෝධාතුවද මනෝවිඤ්ඤාණධාතුවද පවතිත්ද ඒ රූපය මනෝධාතුවටද මනෝවිඤ්ඤාණධාතුවටද යෙදුන ධර්මයන්ටද නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**9 උපනිස්සය ප්‍රත්‍යය යනු**

පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට ඇතැම් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව අකුසල ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අකුසල ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට ඇතැම් උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අකුසල ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු අබ්‍යාකත ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට

උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අබ්‍යාකත ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෘතු භෝජනද උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පුද්ගලයාද උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සේනාසනයද උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**10 පුරේජාත ප්‍රත්‍යය යනු**

චක්ඛායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෝතායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඝානායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ජිව්හායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය

වේ.

කායායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සද්දායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ගන්ධායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රසායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඵොට්ඨබ්බායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය මනෝධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් රූපයක් නිසා මනෝධාතුවද මනෝවිඤ්ඤාණධාතුවද පවතිත්ද ඒ රූපය මනෝධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඒ රූපය මනෝවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ප්‍රවෘත්ති කාලයෙහි පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහිදී පුරේජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය නොවේ.

**11 පච්ඡාජාත ප්‍රත්‍යය යනු**

පසුව උපන් චිත්ත චෛතසික ධර්මයෝ කලින් උපන් රූපයන්ට පච්ඡාජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**12 ආසේවන ප්‍රත්‍යය යනු**

පූර්ව පූර්ව කුසල ධර්මයෝ පසු පසු කුසල ධර්මයන්ට ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව අකුසල ධර්මයෝ පසු පසු අකුසල ධර්මයන්ට ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. පූර්ව පූර්ව වූ ක්‍රියාඅබ්‍යාකත ධර්මයෝ පසු පසු ක්‍රියාඅබ්‍යාකත ධර්මයන්ට ආසේවන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**13 කර්ම ප්‍රත්‍යය යනු**

කුසලාකුසල කර්මය විපාක ස්කන්ධයන්ට හා කර්මජ රූපයන්ට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චේතනාව සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා ඒ නිසා උපදින රූපයන්ට කර්ම ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**14 විපාක ප්‍රත්‍යය යනු**

අරූපී විපාක ස්කන්ධ සතර ඔවුනොවුන්ට විපාක ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**15 ආහාර ප්‍රත්‍යය යනු**

කබලිංකාර ආහාරය මේ කයට ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. අරූපී ආහාර සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා ඒ නිසා උපදින රූපයන්ට ආහාර ප්‍රත්‍යයෙන්

ප්‍රත්‍යය වේ.

**16 ඉන්ද්‍රිය ප්‍රත්‍යය යනු**

චක්ඛුන්ද්‍රිය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෝතින්ද්‍රිය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඝානින්ද්‍රිය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ජිව්හින්ද්‍රිය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

කායින්ද්‍රිය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපජීවිතින්ද්‍රිය කර්මජ රූපයන්ට ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. අරූපී ඉන්ද්‍රියෝ සම්ප්‍රයුත්ත ධර්මයන්ටද ඒ නිසා උපදින රූපයන්ටද ඉන්ද්‍රිය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**17 ඣාන ප්‍රත්‍යය යනු**

ඣාන අංගයෝ ඣානසම්ප්‍රයුත්ත ධර්මයන්ටද ඒ නිසා උපදින රූපයන්ටද ඣාන ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**18 මාර්ග ප්‍රත්‍යය යනු**

මාර්ග අංගයෝ මාර්ගසම්ප්‍රයුත්ත ධර්මයන්ටද ඒ නිසා උපදින රූපයන්ටද මාර්ග ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**19 සම්ප්‍රයුත්ත ප්‍රත්‍යය යනු**

අරූපී ස්කන්ධ සතර ඔවුනොවුන්ට සම්ප්‍රයුත්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**20 විප්පයුත්ත ප්‍රත්‍යය යනු**

රූපී ධර්ම අරූපී ධර්මයන්ට විප්පයුත්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. අරූපී ධර්ම රූපී ධර්මයන්ට විප්පයුත්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**21 අත්ථි ප්‍රත්‍යය යනු**

අරූපී ස්කන්ධ සතර ඔවුනොවුන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සතර මහාධාතූහු ඔවුනොවුන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රතිසන්ධික්ෂණයෙහි නාම-රූප ඔවුනොවුන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චිත්ත චෛතසික ධර්මයෝ චිත්තජ රූපයන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මහාභූත සතර උපාදායරූපයන්ට අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චක්ඛායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෝතායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඝානායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ජිව්හායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

කායායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සද්දායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ගන්ධායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රසායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඵොට්ඨබ්බායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය මනෝධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් රූපයක් නිසා මනෝධාතුවද මනෝවිඤ්ඤාණධාතුවද පවතිත්ද ඒ රූපය මනෝධාතුවටද මනෝවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**22 නත්ථි ප්‍රත්‍යය යනු**

සමනන්තර නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ වර්තමාන චිත්ත චෛතසික ධර්මයන්ට නත්ථි ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**23 විගත ප්‍රත්‍යය යනු**

සමනන්තර විගත වූ චිත්ත චෛතසික ධර්මයෝ වර්තමාන චිත්ත චෛතසික ධර්මයන්ට විගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**24 අවිගත ප්‍රත්‍යය යනු**

අරූපී ස්කන්ධ සතර ඔවුනොවුන්ට අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. සතර මහාධාතූහු ඔවුනොවුන්ට අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රතිසන්ධික්ෂණයෙහි නාම-රූප ඔවුනොවුන්ට අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චිත්ත චෛතසික ධර්මයෝ චිත්තජ රූපයන්ට අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. මහාභූත සතර උපාදායරූපයන්ට අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

චක්ඛායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සෝතායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඝානායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ජිව්හායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

කායායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපායතනය චක්ඛුවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

සද්දායතනය සෝතවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ගන්ධායතනය ඝානවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රසායතනය ජිව්හාවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

ඵොට්ඨබ්බායතනය කායවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

රූපායතනය, සද්දායතනය, ගන්ධායතනය, රසායතනය, ඵොට්ඨබ්බායතනය මනෝධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

යම් රූපයක් නිසා මනෝධාතුවද මනෝවිඤ්ඤාණධාතුවද පවතිත්ද ඒ රූපය මනෝධාතුවටද මනෝවිඤ්ඤාණධාතුවටද ඒ හා යෙදුන ධර්මයන්ටද අවිගත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ.

**බුද්ධසාසනය බොහෝ කල් බැබලේවා!!!**